
# සුහුරුකත 2019

දෙවන කලාපය



කාන්තා හා ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය

# දෙවන කලාපය

## උපදේශනය

ඒ.එස්.එම්.එස් මහානාම
ලේකම්
කාන්තා හා ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය

## මග පෙන්වීම

ජේ.පී.එස්.ජයසිංහ
අධ්‍යක්ෂ (සැලසුම් හා අධීක්ෂණ)
කාන්තා හා ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය

## සංස්කරණය

හිරුනි විතානගේ
සහකාර අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ)
කාන්තා හා ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය

## සංස්කරණ සහාය

අමා රත්නසිරි මහත්මිය
තුෂාර සුරවීර මහත්මිය
අචලා වීරසිංහ මෙනවිය
ප්‍රියානි ඉන්දිකා මෙනවිය
විමල් පෙරේරා මහතා

## පිටකවර නිර්මාණය කිරීම

ප්‍රියානි ඉන්දිකා මෙනවිය

## දායක ලේඛකයින්

ශ්‍රී ලංකා සර්ට්
ශ්‍රී ලංකාවේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ආයතනය
හිරුනි විතානගේ මහත්මිය
අමා රත්නසිරි මහත්මිය
ප්‍රියානි ඉන්දිකා මෙනවිය
තුෂාර සුරවීර මහත්මිය

## ප්‍රකාශනය

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ඒකකය
කාන්තා හා ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය

© 2019 කාන්තා හා ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය

# පටුන


| | |
|---|---|
| පෙරවදන…………………………………………………………………………… | III |
| කාන්තා හා ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යතුමියගේ පණිවුඩය…..………… | IV |
| කාන්තා හා ළමා කටයුතු රාජ්‍ය අමාත්‍යතුමාගේ පණිවුඩ……………………………….. | V |
| කාන්තා හා ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ ලේකම්තුමියගේ පණිවුඩය…………..…… | VI |
| තොරතුරු තාක්ෂණයේ සමාජ වැදගත්කම…………………………………………….. | 1 |
| අන්තර්ජාලය ආරක්ෂිතව හා නිවැරදිව භාවිත කිරීමේ වැදගත්කම……………………… | 4 |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ ශ්‍රී ලාංකික කාන්තාවන්ට ඇති අභියෝග………. | 9 |
| අම්මේ තාත්තේ ඔබේ දරුවාට නිවැරදි මග පෙන්වන්න………………………………..... | 11 |
| සුහුරුලිය……………………………………………………………………..……. | 13 |
| මුහුණුපොත හරහා සිදුවන අපරාධවලින් වැලකීමට නම්……………………………….. | 15 |
| නිවසේ ආරක්ෂක කැමරා පද්ධතියක් සවි කිරීම වැදගත් වන්නේ ඇයි?........................... | 17 |
| ව්‍යාජ වෙබ් අඩවි හඳුනා ගන්නේ කෙසේද …………………………………………… | 21 |
| මොකක්ද මේ උපාංග පදනම් කරගත් අන්තර්ජාලය (Internet of Things) කියන්නේ ?..... | 23 |
| Google Chrome කෙටිමං යතුරු…………………………………………………… | 25 |
| කාන්තා ඔබට කරදරයක්ද ? උදව්වක් අවැසිද ? ……………………………………….. | 26 |

# පෙරවදන

කාන්තාවන් සවිබල ගැන්වීමේදී ඔවුන් සතු කුසලතාවයන්, දැනුම සහ තාක්ෂණය මගින් ඔප් නැංවීම අත්‍යාවශ්‍යය. මෙම අමාත්‍යාංශයේ විෂය පථයට ගැනෙන එය අතිගරු ජනාධිපතිතුමන්ගේ ප්‍රතිපත්ති ප්‍රකශයේ සඳහන් සමාජ ආර්ථිකයට දායක වන කාන්තා පරපුරක් බිහිකිරීම යන්නෙන්ද මනාවට පිළිබිඹු වේ. ඵලදායී හා කඩිනම් සංවර්ධනයකට ප්‍රවිෂ්ඨ වීමේ ක්‍රියාදාමයේදී ජනගහනයෙන් අඩකටත් වඩා වැඩි ප්‍රතිශතයක් ඇති කාන්තාවන් මේ සඳහා දායක කර ගැනීම සහ එම සංවර්ධනයේ යහපත් ප්‍රතිඵල ඔවුනට ලබාදීමේ ප්‍රවේශයන් හඳුන්වා දීම අප විසින් සිදු කළ යුතුය. එහි එක් ප්‍රයත්නයක් වශයෙන් ඇරඹුණු කාන්තා සහ ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය මගින් කාන්තාවන් තොරතුරු තාක්ෂණයෙන් සවිබල ගැන්වීම සඳහා පලකරන ලද "සුහුරුකත" නම් වූ තොරතුරු තාක්ෂණ සගරාවේ දෙවැනි කලාපය මෙලෙස එළි දක්වමු.

ආංකිත සාක්ෂරතාවයෙන් යුතු කාන්තා ප්‍රජාවක් බිහිකිරීම තුලින් සමාජ ආර්ථික සංවර්ධනය කරා කඩිනම්ව හා ඵලදායීව ලඟා වෙමින් වඩාත් යහපත් ජීවන තත්ත්වයක් උදාකර ගැනීමට අවස්ථාව සැපයීම මෙම සඟරාවේ මූලික අරමුණයි.

මෙය ඉතා පුළුල් ඉදිරි ගමනක ආරම්භයක් වන අතර සමස්ථ ශ්‍රී ලාංකික ප්‍රජාව වෙතම ඩිජිටල් තාක්ෂණයේ ප්‍රතිලාභ ගෙනයාම සඳහා සිදුකරන එක් උත්සාහයකි. මෙමගින් පාඨක ඔබගේද අදහස් උදහස් වලටද වේදිකාවක් සලසා දීමට බලාපොරොත්තු වන අතර සාරවත් ලිපි, තොරතුරු, නිර්මාණ මෙන්ම යෝජනාද සැපයීමෙන් ඔබට ද මෙම යහ කාර්යයට දායකත්වය ලබා දිය හැකිය.

ශ්‍රී ලංකාව තොරතුරු තාක්ෂණ භාවිතයන් හා හැකියාවන් වඩා ඵලදායීව භාවිතා කරන සහ එහි ප්‍රතිලාභයන්ද අත් විඳින වඩාත් ශක්තිමත් සහ පිරිපුන් කාන්තා පරපුරක් සිටින සෞභාග්‍යමත් රටක් වේවායි ප්‍රර්ථනා කරමු.

# කාන්තා හා ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යතුමියගේ පණිවුඩය



රටක කාන්තාවකගේ අභිමානය හා සුරක්ෂිතතාවය තහවුරු වන්නේ ඇය තම පවුල් පරිසරය තුලත් සමාජ පරිසරය තුලත් අත්විදින යහපත් සාර්ථකත්වයන් මතයි. ඒ සඳහා කාන්තාවන්ට ඇති අයිතිය හා ඔවුන්ට ඇති උනන්දුව තවත් ඔප් නැංවීම සඳහා ප්‍රකාශයට පත් කෙරෙන සුහුරුකත සඟරාවේ සිංහල මාධ්‍යයෙන් පලවන ප්‍රථම කලාපය වෙනුවෙන් විෂය භාර අමාත්‍යවරිය විදියට පණිවුඩයක් නිකුත් කිරීමට ලැබීම ඉතා භාග්‍යයක් කොට සලකමි. එදිනෙදා වෙනස් වන හා සංකීර්ණ වන ලෝකයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳ නිවැරදි දෘෂ්ඨි කෝණයකින් බලා යහපත් දේ පමණක් ලබා ගැනීමට අවශ්‍ය දැණුම හා සංවේදීතාවය ලබා දීම හා සතුට හා සංවේදීතාවය සපිරිණු පවුල් පරිසරයක් තුලින් ශ්‍රී ලාංකික කාන්තාවන් හා ළමුන් ඇතුලු සමස්ත ජන ප්‍රජාවම තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයෙන් සවිබල ගැන්වීම මෙම ප්‍රකාශනයෙන් අපේක්ෂා කරයි. තොරතුරු තාක්ෂණයෙන් හෙබි සමාජයක් වෙත විශ්වාසයෙන් යුතුව පිය නැගීමටද ඒ තුලින් කාන්තාවන්ගේ ජීවන තත්වය නගා සිටුවීමට ද කාන්තාව මුහුණදෙන සමාජීය හා ආර්ථික ගැටළු වෙනුවෙන් විසඳුම් සොයා ගැනීමට ද මෙම ප්‍රයත්නය තුලින් හැකියාව ලැබේවායි ප්‍රාර්ථනා කරමි.



**නීතිඥ පවිත්‍රා වන්නිආරච්චි**


ළමා හා කාන්තා සහ සමාජ ආරක්ෂණ අමාත්‍ය

සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍ය

# කාන්තා හා ළමා කටයුතු රාජ්‍ය අමාත්‍යතුමාගේ පණිවුඩය



වත්මන් ශ්‍රී ලංකාව සෞභාග්‍යමත් රාජ්‍යයක් බවට පරිවර්ථනය කිරීමේ ව්‍යායාමයේ දී රටේ ජනතාවගේ සාරධර්ම හා සිතුම් පැතුම් සංවර්ධනය කිරීම මෙන්ම ඔවුන්ගේ තාක්ෂණික දැනුම ද අභියෝගයන්ට මුහුණ දීමට හැකිවන අයුරින් වැඩි දියුණු කිරීම අත්‍යාවශ්‍ය වේ. මෙම කර්තව්‍යයේදී ශ්‍රී ලාංකිය කාන්තාවන් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයෙන් සහ වෘත්තිය කුසලතාවයන්ගෙන් සන්නද්ධ කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම සඳහා අප අමාත්‍යාංශය මඟින් වැඩසටහන් බොහොමයක් සිදු කරනු ලබයි. එහි එක් ප්‍රවේශයක් ලෙස මෙම අමාත්‍යාංශය මඟින් විශේෂයෙන්ම කාන්තාවන්ගේ එදිනෙදා කටයුතු මෙන්ම සමාජීය හා ආර්ථික කටයුතු වඩාත් කාර්යක්ෂමව හා ඵලදායිව ඉටු කර ගැනීම සඳහා තොරතුරු තාක්ෂණ දැනුම ඉහල නැංවීමේ අපේක්ෂාවෙන් සෑම වර්ෂයකදීම 'සුහුරුකත' නමින් සඟරා කලාප 2ක් එළි දැක්වීමට තීරණය කර ඇත. මේ සඳහා කාන්තා හා ළමා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ අමාත්‍යවරයා වශයෙන් සිංහල මාධ්‍යයෙන් එළිදක්වන ප්‍රථම 'සුහුරුකත' සඟරාව සඳහා පණිවුඩයක් නිකුත් කිරීමට ලැබීම ගැන මම බෙහෙවින් සතුටට පත්වෙමි. අප අපේක්ෂා කරන මෙවැනි දැනුම හා තොරතුරු බෙදා හරින ප්‍රවේශයන් තුළින් අප නිරතුරුව උත්සහ දරන්නේ කාන්තාවන්ට ඔවුන් අභිමුව ඇති අභියෝග ජයගත හැකි මෙන්ම රටේ සංවර්ධනයට ඵලදායිව දායක විය හැකි චරිතයක් බවට ඔවුන් ඔසවා තැබීමයි. මොහොතින් මොහොත වෙනස් වන නූතන සමාජයේ පැවැත්මට සහ සංවර්ධනයට අත්‍යවශ්‍ය සාධකයක් වන තාක්ෂණික මෙවලම් හා භාවිතයන් තවදුරටත් ශ්‍රී ලංකික කාන්තාවන් අතර ප්‍රවර්ධනය කිරීමට හැකි නම් එය රටේ සමස්ථ සංවර්ධනයට විශාල පිටුවහලක් වනු ඇතැයි මම විශ්වාස කරමි.



**විජිත බේරුගොඩ**


කාන්තා හා ළමා කටයුතු රාජ්‍ය ඇමති

# කාන්තා හා ළමා කටයුතු
# ලේකම්තුමියගේ පණිවුඩය



වත්මන් සමාජය වඩාත් සංකීර්ණ වීමත් සමඟ ඒ සමාජයේ ජීවත්වීම සඳහා කාන්තාවන්ටද තම දැනුම, ආකල්ප, කුසලතාවන්හි හා ජීවන රටාවේ වෙනස්කම් ඇතිකර ගැනීම අත්‍යවශ්‍ය වේ. සමාජය තුල මුහුණදෙන අභියෝගයන් ජය ගැනීමට කාන්තාවන්ට අවශ්‍ය දැනුම ලබා දීම හා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතා කිරීමෙන් ඔවුන්ගේ හැකියාවන්ගෙන් උපරිම ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා අවශ්‍ය අවස්ථාවන් නිර්මාණය කිරීමේ අරමුණින් කාන්තා හා ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය මඟින් තොරතුරු තාක්ෂණය ආශ්‍රය කර ගනිමින් සුහුරුකත නමින් සම්පාදනය කරනු ලබන මෙම සඟරාවේ අන්තර්ගතය තුළින් කාන්තාවන්ට මෙන්ම සමස්ථ සමාජයට ම නව තාක්ෂණ භාවිතයන් තුළින් තම පවුල් සංස්ථාවන් යහපත්ව ගොඩනගා ගැනීමට සුදුසු වටපිටාවන් නිර්මාණය කර ගැනීමෙහි ලා අවශ්‍ය කරන සංවේදිතාවය හා දැනුම ලබා දීමට උත්සහ කෙරේ.

ඒ අනුව මෙම සඟරාව තුලින් තොරතුරු තාක්ෂණය නිවැරදිව භාවිතා කරමින් සමෘද්ධිමත් අනාගතයක් ගොඩනගා ගැනීමට හැකි අභිමානවත් ශ්‍රී ලාංකීක කාන්තා පරපුරක් බිහි වේවායි පතමි.



**ඒ.එස්.එම්.එස් මහානාම**
ලේකම්
කාන්තා හා ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය

# තොරතුරු තාක්ෂණයේ සමාජ වැදගත්කම



අතීතයේ සිට වර්තමානය දක්වා මිනිසා විසින් විවිධ යුග ගණනාවක් පසු කරමින් වර්තමාන තාක්ෂණ යුගයට එළඹ ඇත. කලින් පැවති සෑම යුගයකටම වඩා වර්තමාන තාක්ෂණ යුගය ඉතාමත් දියුණු යි. සන්නිවේදනය සහ තොරතුරු තාක්ෂණය මානවයාගේ සමාජ අවශ්‍යතාවක් මෙන්ම සමාජ සබඳතා ශක්තිමත් කරන සහ ගොඩනංවන ප්‍රධාන සාධකයක් බවට ද පත් වී ඇත. මිනිසාගේ මෙම සීඝ්‍ර දියුණුවත් සමඟම ඔවුන්ගේ අවශ්‍යතාවයන් මෙන්ම දැනුමත් වැඩි වී ඇත. ඒ සමඟම ඔවුන්ගේ අවශ්‍යතාවයන් පෙරට වඩා සංකීර්ණ වී ඇත.

අද වනවිට තොරතුරු තාක්ෂණයෙන් තොර සමාජයක් ගැන සිතීමටවත් බැරි තරමට තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය සමග සමාජය බද්ධ වී ඇත. ලෝකයේ තිබෙන සියළුම ක්ෂේත්‍ර කුමන ආකාරයකින් හෝ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය සමඟ අත්වැල් බැඳගෙන ඇත. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ සිදුවූ සීඝ්‍ර සංවර්ධනයත් සමඟ අද ලෝකය විශ්ව ගම්මානයක් බවට පත්ව ඇත. මෙකී තාක්ෂණික සංවර්ධනය සමඟ බද්ධ වී මානව සම්බන්ධතා නව මුහුණුවරක් ගෙන ඇති බව දක්නට ලැබේ.

භූගෝලීය දුරස්ථ බව පරදා දේශීය මෙන්ම ජාත්‍යන්තර වශයෙන්ද ඕනෑම තොරතුරක් ලොව ඕනෑම තැනක සිට සුළු වේලාවක් ඇතුළත කාල භේදයකින් තොරව දැන ගැනීමට හැකියාවක් ලැබී ඇත. මෙලෙස නව මුහුණුවරකින් යුත් මාධ්‍ය සංස්කෘතියක් නිර්මාණය කර ගැනීම පිණිස තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය මගින් විශාල බලපෑමක් සිදු කර ඇත. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ භාවිතයන් හා යෙදුම් මගින් අධ්‍යාපනය, සෞඛ්‍ය, දේශපාලන, කෘෂිකර්මාන්තය, ව්‍යාපාර වැනි ක්ෂේත්‍ර ගණනාවක විශාල ප්‍රගමනයක් ඇති වී තිබේ. මේ සියල්ලම තොරතුරු තාක්ෂණික දියුණුව හරහා ලබා ගත් සමාජීය ප්‍රතිලාභයන්ය.



තොරතුරු තාක්ෂණයේ දියුණුවත් සමග ලෝකයේ ආර්ථිකය විද්‍යුත් ආර්ථිකයක් (E-Economy) බවට පත් වී තිබේ.මේ නිසා ලොව ඕනෑම ප්‍රදේශයක ඇති භාණ්ඩ හා සේවාවන් සඳහා අන්තර්ජාල වෙළඳපොලක් නිර්මාණය කර ගත හැකි වීම, පරිභෝජන අවශ්‍යතා ලබාගත හැකි වීම, පහසුවෙන් හා කාල භේදයකින් තොරව භාණ්ඩ හා සේවා ලබාගත හැකිවීම, විනිමය ගැටලු අවම වීම වැනි ආර්ථික ප්‍රතිලාභ රාශියක් ලබා ගැනීමට හැකියාව ලැබී ඇත.

E-රාජ්‍ය සංකල්පය හා E-Learning සංකල්පය යන සංකල්ප සඳහා ද දැන් ඇඩි අවධානයක් යොමු වී තිබේ. පරිගණකයක් සහ අන්තර්ජාල සබඳතාවක් පවතින සෑම පුද්ගලයෙකුටම තොරතුරු තමා අභියසට හමුවට ගෙන්වා ගැනීම එතරම් අපහසු කර්තව්‍යයක් නොවේ .තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ ව්‍යාප්තිය හේතුකොට ගෙන නූතන අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ ද විප්ලවීය වෙනස්කම් රාශියක් සිදු වෙමින් පවතී. ඇතැම් විෂය ක්ෂේත්‍රයන් උපාධි මට්ටම දක්වා හැදෑරීම නිවසේ ඇති පරිගණකය සහ අන්තර්ජාලය උපයෝගී කරගෙන සිදු කිරීමට හැකියාව ලැබී තිබේ. එමෙන්ම දැනටමත් පරිගණකය සහ අන්තර්ජාලය භාවිතා කරමින් නිවසේ සිට රැකියාවල නිරත වන අවස්ථා ද බහුලව දක්නට ලැබේ.

බොහෝ දෙනෙක් සාම්ප්‍රදායික තැපැල (Normal Post) වෙනුවට විද්‍යුත් තැපැල (E-mail) භාවිතා කරමින් සන්නිවේදනය ආරම්භ කර ඇත. තම ව්‍යාපාර කටයුතු දියුණු කර ගැනීමටද තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ යෙදීම් වල වැඩි භාවිතාවය විශේෂ භාවිතාවයක් ඇති බව දක්නට ලැබේ. දැනුම,



දත්ත සහ උපදෙස් ක්ෂණිකව බෙදා හදා ගැනීමටත්, අඩු වියදමකින් මාර්ගගත වෙළඳසැලක් ආරම්භ කිරීමටත්, ව්‍යාපාරයක් ආරම්භ කිරීමේ දී මුහුණ පාන බාධක අඩු කිරීමටත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයෙන් පහසුකම් සලසයි. මෙමගින් පැහැදිලි වනුයේ වර්තමානයේදී තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ පරිණතභාවය ආර්ථික වර්ධනය සමඟ සමීපව බැඳී පවතින බවයි.

තොරතුරුහා සන්නිවේදන තාක්ෂණය මගින් දියුණු සංවර්ධනය වූ රටවල් හි මෙන්ම ශ්‍රී ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවතින රටකට වුව ද ලබාගත හැකි හැකි මෙහෙවර කිසිසේත් ලඝු කර දැක්විය නොහැකිය. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයෙහි නව සොයා ගැනීම්, අන්තර්ගතය සහ යටිතල පහසුකම් යන ක්ෂේත්‍ර වල ශ්‍රී ලංකාව ඉහළ ප්‍රගතියක් අත්කර ගෙන තිබේ. එක් එක් රටවල් ගෝලීය තාක්ෂණ ජාලය හා සම්බන්ධ ව සිටී ද? යන්න පිළිබඳව විමර්ශනය කිරීමේ දී, ශ්‍රී ලංකාව බොහෝ රටවලට සාපේක්ෂව වඩාත් ඉදිරියට පැමිණ ඇති බවත් දක්නට ලැබේ.

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය මගින් ලැබී ඇති හිතකර ප්‍රතිඵල හා ප්‍රතිලාභ බොහොමයකි. නමුත් මෙමඟින් ඇතිවූ අහිසි ප්‍රථිඵල රාශියක්ද නැතුවාම නොවේ. විශේෂයෙන් දෛනික අධ්‍යාපන කටයුතු වලින් ඈත්වී, සීමාව ඉක්මවා යමින් පරිගණකය හා අන්තර්ජාල භාවිතා කිරීම දක්නට ලැබීම කණගාටුවට කරුණකි. මෙහිදී දෙමාපියන්ගේ මෙන්ම ගුරුභවතුන් ගේ ද වගකීමක් විය යුත්තේ දූ දරුවන් හට සන්නිවේදනය හා තොරතුරු තාක්ෂණයට අදාළ උපකරණ හා මෙවලම් හඳුන්වා දීමත් ඒවා නිවැරදිව පරිහරණය කරන ආකාරය කියා දීමත්ය.

# අන්තර්ජාලය ආරක්ෂිතව හා නිවැරදිව භාවිත කිරීමේ වැදගත්කම



අන්තර්ජාලය යනු දත්ත ගබඩා කිරීම, සකස් කිරීම හා හුවමාරු කිරීම සඳහා සකස් වූ ජාලකරණ පද්ධතියකි. ඕනෑම පුද්ගලයෙකුට අන්තර්ජාලය මගින් ලැබෙන ප්‍රයෝජන නිසාම බොහෝදෙනා මෙය භාවිතයට පෙළඹේ.ලෝක ජනගහනයෙන් 40% පමණ පිරිසක් අද වන විට අන්තර්ජාලය භාවිත කරන බව http://www.internetlivestats.com වෙබ් අඩවිය පෙන්වා දෙයි.

අන්තර්ජාලය ඔස්සේ ලබා ගන්නා වඩාත් ප්‍රචලිත සේවාවක් ලෙස විද්‍යුත් තැපෑල සැලකිය හැක. මෙමගින් කාර්යාලීය කටයුතු මෙන්ම පුද්ගලික කටයුතු වලදී ද අවශ්‍ය වන ලිපිගොනු, ඡායාරූප ද හුවමාරු කරගත හැක. එමෙන්ම අන්තර්ජාලය ඔස්සේ අපට අවශ්‍ය කරන ලිපි, ඡායාරූප වීඩියෝ පට වැනි දෑ ද බාගත කර ගත හැක. එමෙන්ම පාසල් හා විශ්ව විද්‍යාල සිසුන්ට අවශ්‍ය තොරතුරු හා ලෝකයේ ඕනෑම පාසලක, විශ්ව විද්‍යාලයක හෝ අධ්‍යාපනික ආයතනයකට අයත් සම්පත් ලබා ගැනීමට ද මෙමගින් හැකියාව ලැබේ. සමහර අවස්ථා වල මෙම තොරතුරු නොමිලේ බාගත කල හැකි වේ.

විනෝදාස්වාදය සඳහා අන්තර්ජාල වීඩියෝපට, චිත්‍රපට නැරඹීම මෙන්ම පරිගණක ක්‍රීඩා කිරීමද සිදු කල හැක. විවිධ රටවල තිබෙන අධ්‍යාපන ආයතන වල විවිධ පාඨමාලා හැදෑරීමටත් එමගින් සහතිකපත් හා වෘත්තිය සුදුසුකම් ලබා ගැනීමටත් වර්තමානයේ හැකියාව පවතී.

අන්තර්ජාලයේ තවත් ප්‍රසිද්ධ වූ සේවාවක් නම් සමාජ මාධ්‍යයයි. වර්තමානයේ සමාජ මාධ්‍යයන් භාවිතා නොකරන කෙනෙකු නොමැති තරම්ය. එයට හේතුව වී ඇත්තේ ලෝකයේ ඕනෑම තැනක සිටින පුද්ගලයකුට ඉතා පහුසුවෙන් හා ක්ෂණිකව තවත් පුද්ගලයකු හා සම්බන්ධවීමට ඇති හැකියාවයි. මෙහිදී තමන් හඳුනන මිතුරන් මෙන්ම අලුතෙන් මිතුරන් හඳුනාගෙන ඔවුන් අතරද තොරතුරු හුවමාරු කිරීමට සමාජ මාධ්‍යය ඔස්සේ හැකියාව ලැබේ. එමෙන්ම වෙළඳ දැන්වීම් ප්‍රචාරණ කටයුතු සඳහා ද දැන් සමාජ මාධ්‍යය භාවිතා කළ හැක. ක්ෂණිකව තම නෑ හිතමිතුරන් හා සම්බන්ධ වීමේ පහසුව නිසාම සමාජ මාධ්‍ය භාවිතා කිරීමට බොහෝ අය පෙළඹේ.



අන්තර්ජාලය මගින් තවත් අපට ලබා ගත හැකි සේවාවක් නම් වෘත්තිය පුරප්පාඩු සඳහා අයදුම් කල හැකි වීමයි. එමෙන්ම ග්‍රැෆික් නිර්මාණ, මෘදුකාංග සහ අනෙකුත් නිෂ්පාදන අලෙවි කිරීම සඳහා ද අන්තර්ජාලය ඉවහල් වේ.

එමෙන්ම තමන්ගේ වෙළදාම් කටයුතු සිදු කිරීමට, එනම් භාණ්ඩ විකිණීම මෙන්ම මිලදීගැනීම සඳහා ද දැන් අන්තර්ජාලය භාවිතා කළ හැක. අන්තර්ජාලය මගින් ගෝලීය වෙළඳපොලක් නිර්මාණය වීම නිසා භාණ්ඩ වල මිල සැසදීමත් භාණ්ඩ විකිණීමට හා මිලදී ගැනීමට ඇති අවස්ථාවන් වැඩි වීමත් සිදු වී තිබේ. මෙහිදී e-බැංකුකරණය ද ඉතා වැදගත් සේවාවක් ලෙස දැක්විය හැක. මුදල් වෙනත් ගිණුමකට බැර කිරීම , බිල් ගෙවීම, ශේෂය දැන ගැනීම වැනි බොහෝ සේවාවන් E-බැංකුකරණය මගින් සිදු කල හැක. E-වෙළඳාම් හා E-බැංකුකරණයද එකිනෙක හා යාවූ සේවාවන් දෙකක් ලෙස සැලකිය හැක.

අන්තර්ජාලය හා සම්බන්ධ වූ ක්‍රියාකාරකම් සිදුවන ස්ථානය සයිබර් (cyber) අවකාශය ලෙස හඳුන්වයි.




නමුත් මෙලෙස අන්තර්ජාල සේවාවන් ලබා ගැනීමේදී තම පුද්ගලික දත්ත, ඡායාරූප යනාදිය සයිබර් අවකාශයට මුදාහැරෙන බව බොහෝ දෙනෙකුට අමතක වන කරුණකි. මෙහිදී එම දත්ත වෙනත් පුද්ගලයන් විසින් අවභාවිතා කල හැක. සයිබර් අපරාධ සිදු වීමට වඩාත් ඉඩ සැලසෙන්නේ මෙලෙස අනාරක්ෂිතව පුද්ගලයන්ගේ තොරතුරු සයිබර් අවකාශයේ තැන්පත් කර තිබීමයි. සයිබර් අපරාධයක් යනු පරිගණකයක් හෝ Smart

දුරකථනයක් හෝ අන්තර්ජාල පහසුකමක් සහිත මෙවලමක් භාවිතා කිරීමෙන් සිදුකරන අපරාධයකි. බොහෝ විට අන්තර්ජාල අපරාධකරුවන් (Cybercriminals) තමන්ට ලාභ ප්‍රයෝජන ලබාගැනීමට මෙම අපරාධ සිදුකරන අතර විටෙක වෙනත් පරිගණක හා අන්තර්ජාල පහසුකම් අක්‍රීය කිරීමට හෝ නීත්‍යානුකූල නොවන තොරතුරු මුදා හැරීමට සයිබර් අපරාධ සිදුකරති. අන්තර්ජාලය භාවිතයෙන් අපරාධය සිදුකිරීමේදී වින්දිතයා (Victim) හා අපරාධකරු (Criminal) රටවල් දෙකක වුවද සිටිය හැක.

අන්තර්ජාල භාවිතයේ පහසු බව, එහි වේගවත් බව මෙන්ම එහි රහසිගත බව ආරක්ෂා කිරීමට හැකිවීමත් නිසා සයිබර් අපරාධ පහසුවෙන් සිදු කළ හැක. එතරම් තාක්ෂණික දැනුමක් නොමැති පුද්ගලයන් මෙන්ම කණ්ඩායම්ද සයිබර් අපරාධ සිදු කරන අතර පුහුණු සංවිධානාත්මක කණ්ඩායම් මහා පරිමාණයෙන් සයිබර් අපරාධ සිදුකරති. බොහෝ විට මෙම අපරාධ සයිබර් අපරාධ පිළිබඳ නීතිරීති දුර්වල රටවල් ඉලක්ක කර ගනිමින් සිදු කෙරේ.

**වර්තමානයේ ශ්‍රී ලංකාව තුල වැඩිපුර වාර්තාවන සයිබර් අපරාධ ආශ්‍රිත සිද්ධීන් පහත පරිදි වේ.**

### 1. ව්‍යාජ ගිණුම් සෑදීම (Fake accounts)




පුද්ගලයකු හා සම්බන්ධ නම, උපන් දිනය, පදිංචි ප්‍රදේශය, පාසල වැනි දත්ත හා එම පුද්ගලයාගේ ඡායාරූප භාවිතා කර Facebook, Instagram වැනි සමාජ මාධ්‍ය ඔස්සේ ව්‍යාජ ගිණුම තැනීම අද ඕනෑතරම් දැක ගත හැක. මෙලෙස සාදා ගන්නා ගිණුම් භාවිතා කරමින් අදාල පුද්ගලයාට අපහස වන අන්දමින් හැසිරෙමින් ඔවුන්ගේ චරිතය ඝාතනය කිරීමට තැත් කිරීම මෙහි ප්‍රධාන අරමුණ වේ.

### 2. ඡායාරූප අවභාවිතය ( Photo misuse)



සමාජ මාධ්‍ය ඔස්සේ පළ කරන තමන්ගේ ඡායාරූප වල ආරක්ෂක සැකසුම් (Privacy settings) නිසි ආකාරව සකසා නොමැති අවස්ථාවන් වලදී එම ඡායාරූප තම ගිණුමේ නොමැති බාහිර පාර්ශවයන් විසින් බාගත කොට අවභාවිතා කල හැක.

### 3. අන්තර්ජාල බියගැන්වීම් හා හිංසාකිරීම්




මෙහිදී අන්තර්ජාලය හරහා නාමිකව මෙන්ම නිර්නාමිකව ද තර්ජනය කිරීම් අපහාස කිරීම් සිදුවේ. අදාල පුද්ගලයා අපහසුතාවට පත්කිරීමත්, චරිත ඝාතනය කිරීමත්, මානසිකව පීඩාවන්ට පත් කිරීමත් මෙහි අරමුණ වේ. මෙහිදී hacker කෙනෙකු පුද්ගලයකුගේ තොරතුරු සොරකම් කර එම

පුද්ගලයා blackmail කර මුදල් ඉල්ලා සිටියි. බොහෝ අවස්ථා වල පොලිසියේ සහය පැතීම වෙනුවට මුදල් ගෙවා එම තර්ජන සමතයකට පත් කිරීමට වින්දිතයන් පෙළඹේ. නමුත් මුදල් ගෙවූ පසුවද එම තොරතුරු එම පුද්ගලයා විසින් අවභාවිතා නොකරනේ යැයි සහතික විය නොහැක.

## 4. මුදල් වංචා වලට හසු වීම




බොහෝවිට තෑගි, ලොතරැයි දිනුම් ඇදීම, දුරකථන, පරිගණක ලබා දෙන ආකාරයෙන් මිනිසුන් රවටා මුදල් ගැනීම සිදු කරයි. මෙහිදී ප්‍රසිද්ධ ආයතන වල නම් භාවිතා කිරීමද සිදු වේ. එමෙන්ම වෙළඳ දැන්වීම් ප්‍රකාශ කර ඒවාට අත්තිකාරම් මුදල් ලබා ගෙන අදාල භාණ්ඩ ලබා නොදෙන අවස්ථා ද දැක ගත හැක.

ඉහත දැක්වූ සයිබර් අපරාධ ආශ්‍රිත සිද්ධීන් වලට අමතරව වාර්තාවෙන තවත් සයිබර් අපරාධ ආශ්‍රිත සිද්ධින් කිහිපයක් නම්,


- අන්තර්ජාල බැංකු මුරපද සොරා ගැනීම්
- සමාජ ජාලා ගිණුම් වල මුරපද සොරා ගැනීම්
- ණයවර පත් වංචා
- රහස්‍ය වෙළඳ උපක්‍රම සොරකම
- පෞද්ගලික දත්ත ගබඩා තුලට අනවසරයෙන් ඇතුල් වීම.

### අන්තර්ජාලය භාවිතයේ දී කල්පනාකාරී විය යුතු කැරුණු

මෙවන් සයිබර් අපරාධ වලට හසු වූ විට මානසික වශයෙන් පීඩාවට පත්විය හැක. මේ නිසා එවැනි අපරාධයන්ගෙන් ප්‍රවේශම් වීම වඩා වැදගත් වේ. එමෙන්ම එවැනි ගැටළුවක් ඇති වූ විට ඒ සඳහා ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳව දැනුවත්ව සිටීමද වැදගත් වේ.

- අන්තර්ජාලය හරහා තොරතුරු ලබා දෙන සෑම අවස්ථාවකදීම ඔබ තොරතුරු ලබා දෙන්නේ නිවැරදි පුද්ගලයෙකුට / ආයතනයකට දැයි විමසිලිමත් වන්න.
- කිසිම විටෙක තම රහස්‍ය පෞද්ගලික තොරතුරු අන්තර්ජාලය හරහා හුවමාරු නොකරන්න.
- එමෙන්ම අන්තර්ජාලයේ ඇති ක්‍රීඩා, වීඩියෝපට නැරඹීම, සමාජ මාධ්‍ය වැනි සේවාවන් ට ඇබ්බැහි නොවී ඒවා නිසි සීමාවකින් භාවිතා කිරීමට විශේෂයෙන්ම පාසල් සිසුන් හා විශ්ව විද්‍යාල සිසුන් ක්‍රියා කිරීම සුදුසුය.
- අන්තර්ජාලය හරහා රැකියා සඳහා කැඳවීම් කරන අවස්ථාවන් වලදී නිවැරදි තොරතුරු මත පදනම් වී පමනක් මුදල් හා පෞද්ගලික තොරතුරු ලබාදීමට සැලකිලිමත් වන්න.

සමාජ මාධ්‍ය ඔස්සේ සිදු වන සයිබර් අපරාධ සම්බන්ධ වාර්තාවෙන සිද්ධීන්ගෙන් සමාජ ජාල ගිණුම් වල මුරපද සොරකම් කිරීම ප්‍රධාන තැනක් ගනී. මෙවන් සයිබර් අපරාධ වලින් වැළකීම සඳහා ශක්තිමත් මුරපදයක් භාවිතා කිරීම හා විවිධ අන්තර්ජාල ගිණුම් සඳහා එකම මුරපදය භාවිතා නොකිරීම මෙන්ම




මුරපදය වෙනස් කිරීම සිදුකළ හැක. හොඳ ශක්තිමත් මුරපදයක් භාවිතා කිරීමේදී අඩු වශයෙන් අකුරු සහ ඉලක්කම් අටක් වත් ඉක්මවන පදයක් විය යුතුය. එය පහසුවෙන් කෙනෙකුට අනුමාන කළ නොහැකි වචනයක් විය යුතුය.

කිසිම විටක, තමාගේ නම, උපන් දිනය මුරපදයක් ලෙස භාවිතා නොකල යුතුය.බොහෝ සමාජ ජාල ගිණුම් සඳහා ද්වි-සාධක සත්‍යාපනය (two-factor authentication) පහසුකම ලබා දී ඇත. එමගින්, පුද්ගලයෙකු තම පරිශීලක නාමය, මුරපදය ලබා දී ගිණුමකට ඇතුළුවන සෑම අවස්තාවකදීම තම ජංගම දුරකථනයට කේතයක් එවනු ලබයි. එය ඇතුලත් නොකර කිසිවෙකුට එම ගිණුමට ඇතුලත් විමට ඉඩ නොලැබේ. මෙම සේවාව මගින් ද ගිණුමක් Hack වීමේ අවධානම අඩු වේ.

- සෑම විටම තම දත්ත හා තොරතුරු ආරක්ෂිත ආකාරයෙන් තැන්පත් කල යුතු අතර ඡායාරූප භාවිතයේදී වඩාත් සැලකිය යුතුයි. ඡායාරූප සමාජ ජාල තුළ ප්‍රකාශයට පත් කිරීමේ දී තමන්ගේ මිතුරන්ගේ ලැයිස්තුවේ සිටින යහළුවන්ට/ යෙහෙළියන්ට පමණක් දැක ගත හැකි වන සේ settings (සැකසුම්) සකසන්න. එමෙන්ම තම ගිණුමට පුද්ගලිකවම හඳුනන පුද්ගලයන් හැර අනෙකුත් කිසිවෙක් එක් කර නොගැනීමට වග බලා ගත යුතුයි. ගිණුම් වල ඇතිවන ගැටළු පිළිබඳ නිතරම අවධානයෙන් සිටිම හා එවැනි ගැටළු අවස්ථාවකදී වහාම මුරපද වෙනස් කිරීම සිදු කල යුතුය.
- පරිගණක හා ජංගම දුරකථන භාවිතා කිරීමේ දී, පරිගණක වෛරස් වලින් වැලැක්වීමට හැකියාවක් ඇති අන්තර්ජාල ආරක්ෂක පද්ධතියක් භාවිතා කළ යුතුයි (Anti-virus, Virus guard).
- පරිගණකය තුළ භාවිතා කරන මෘදුකාංග යාවත්කාළීන කිරීම සිදු කළ යුතුයි.
- පෞද්ගලික අන්තර්ජාල පහසුකම් භාවිතා කරන්නේ නම් සන්නිවේදන රැහැන් තුලට ඇතුල් වීම වැලක්වීම සඳහා ශක්තිමත් මුරපදයක් භාවිතා කළ යුතුයි.
- ඔබ සයිබර් අපරාධයකට ගොදුරු වන බව හැඟේ නම් ඒ පිළිබඳව වහාම පොලිසිය දැනුවත් කල යුතු බව සිහි තබා ගන්න.
- සයිබර් අපරාධ සිදුවිය හැකි බවට දරුවන් දැනුවත් කිරීම හා සැමවිටම තර්ජනයක් වුවහොත් ඒ පිළිබඳව වහාම දෙමාපියන් දැනුවත් කල යුතු පවසන්න.

# තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ ශ්‍රී ලාංකික කාන්තාවන්ට ඇති අභියෝග



ආසියාතික කාන්තාව සමග සන්සන්දනය කිරීමේදී ශ්‍රී ලාංකික කාන්තාව අධ්‍යාපන මට්ටමින් , සෞඛ්‍ය තත්ත්වයෙන් මෙන්ම සමාජ ආර්ථික මට්ටමින්ද ඉදිරියෙන් සිටී. කාන්තාවගේ දැණුවත් බව සහ ඇගේ ක්‍රියාකාරීත්වය මගින් පවුල සහ සමාජය තව දුරටත් ශක්තිමත් කිරීම තුළින් සමාජ ප්‍රගමනයන්ට කාන්තා සහභාගීත්වය වඩාත් ඵලදායී හා කාර්යක්ෂම ලෙස යොදා ගැනීම රටේ ආර්ථික හා සමාජීය සංවර්ධනයට අත්‍යාවශ්‍යම කාරණයකි. මේ සඳහා කාන්තාවන් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ දැනුමෙන් සන්නද්ධ කිරීම රටේ සංවර්ධනයට වැදගත් වන බව අප කාහටත් නොරහසකි.

ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ප්‍රවර්ධනය කිරීමෙහිලා ප්‍රධානතම මෙවලමක් ලෙස අද තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය හඳුනාගෙන තිබේ. ශ්‍රී ලංකාව මෙන්ම බොහෝ දියුණු වෙමින් පවතින රටවල තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ භාවිතයට ඇති කැමැත්ත, කාන්තාවන්ගේ පිරිමින් හා සසඳන විට කැපී පෙනෙන අඩුවක් දක්නට ලැබේ. ශ්‍රී ලංකාවේ විශේෂයෙන්ම ග්‍රාමීය කාන්තාවන්ගේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ භාවිතය හා හැකියාව විශාල වශයෙන් අඩුවක් පෙන්නුම් කරයි. සංඛ්‍යාලේඛන දත්ත අනුවද මේ බව තහවුරු වේ. එනම් ශ්‍රී ලාංකික සන්දර්භය තුළ තවමත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයට පිවිසීමේදී ස්ත්‍රී පුරුෂ වශයෙන් බෙදීමක් පෙන්නුම් කරයි. මේ නිසා තොරතුරු තාක්ෂණයට පිවිසීම සඳහා අදාළ පහසුකම් තිබියදී පවා කාන්තාවන්ට තාක්ෂණික මෙවලම් භාවිතා කර තම වැඩකටයුතු සිදු කර ගැනීම පිරිමින්ට සාපේක්ෂව අඩු මට්ටමක පවතී.

කාන්තාවන් සවිබල ගැන්වීම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය කෙතරම් ප්‍රයෝජනවත් වුවත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මෙවලම් භාවිතයට

ගැනීම වලක්වන බාධක බොහොමයක් තවමත් දක්නට ලැබේ.



- සමාජ සංස්කෘතික ආකල්පවල බලපෑම
- කාන්තාව සතු ගෘහස්ථ බැඳීම් හා ප්‍රමුඛතා
- දිළිඳු බව
- පරිශීලනයේදී මුහුණපාන ගැටළු
- භාෂා දුර්වලතාවය
- පුහුණුවීමේ ඇති අඩුපාඩු හා දුර්වලතා
- තාක්ෂණය පිළිබඳ විශ්වාසයක් නොමැතිවීම
- ඔවුන් සතුව තාක්ෂණික මෙවලම් නොමැතිවීම
- අධ්‍යාපනික තත්වය අඩු වීම.

ඉහත කරුණුවලට අමතරව බලපාන විශේෂ අභියෝගයක් වී ඇත්තේ කාන්තාවන්ට එරෙහිව සිදුවන හිංසනාත්මක ක්‍රියාවල වැඩිවීමක් ලොවපුරා දක්නට තිබීමයි. විශේෂයෙන්ම කාන්තාවන් අන්තර්ජාලය තුල විවිධ අවමානයන්ට, හිංසනයන්ට අසභ්‍ය පළිගැනීම්වලට ලක්විය හැකිය. මෙවැනි අපරාධයක් වූ විට පැමිණිලි කළ යුත්තේ කාටද යන්න පිළිබඳ මනා දැනුමක් නොමැතිවීම නිසාද මෙම තත්වය වඩාත් නරක අතට පත්වීමට හේතුවක් වී ඇත. කාන්තාවන්ට එරෙහිව අන්තර්ජාල ප්‍රචණ්ඩත්වය හා අපරාධ වැඩිවීම කාන්තාවන් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයෙන් සවිබල ගැන්වීමේ ක්‍රියාවලියටද බාධාවක් වී තිබේ. අන්තර්ජාල භාවිතය පිළිබඳ ප්‍රතිපත්ති, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ප්‍රතිපත්ති, සයිබර් නීති බලාත්මක කිරීමේදී සිදුවන අඩුපාඩු නිසාද කාන්තා පරිශීලකයන්ට අන්තර්ජාල අවකාශයන් අනාරක්ෂිත වී තිබේ. කාන්තාවන්ට තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මෙවලම් භාවිතයට ගැනීමේදී ඒ සඳහා බලපාන ඉහත බාධක ඉවත් කර ගනිමින් ඔවුන්ට තම සමාජ ආර්ථික හා දේශපාලන ඉලක්ක කරා කාර්යක්ෂමව හා ඵලදායීව ළඟා වීමට, වඩා ආරක්ෂාකාරී ලෙස තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතා කරන්නේ කෙසේදැයි යන්න පිළිබඳ දැනුවත් වීම හා දැනුවත් කිරීම ඉතා වැදගත්වේ.

# අම්මේ තාත්තේ ඔබේ දරුවාට නිවැරදි මග පෙන්වන්න.......



අද ලෝකය ගෝලීයකරණය වීමත් සමගම මිනිස්සු, ඔවුන්ගේ ජීවන රටාවල් සහ මුළු සමාජයම වෙනස් වෙලා. ඉතිං ජීවිත වලට සිදු වෙලා තියෙන මේ වෙනස හොඳයිම කියලා කියන්නනම් අමාරුයි. හැබැයි නරකයි කියලා කියන්නත් අමාරුයි. ඒ කියන්නේ මේ වෙනස තුල හොඳ දේ වගේම නරකදේත් තියෙනවා. තාක්ෂණයේ දියුණුව නිසාම ලෝකයේ නව නිපැයුම් ගණනාවක් බිහිවුණා. මේ නිසා අපේ ජීවිත වඩාත් කාර්යක්ෂම සහ ඵලදායි ලෙස හසුරවාගන්න පුළුවන්කමකුත් ලැබුණා. ඉස්සරනම් කාටහරි ලියුමක් යැව්වොත් සති ගණන් මාස ගණන් බලන් ඉන්න ඕන. නමුත් අද තාක්ෂණයේ තිබෙන දියුණුව නිසාම ඒ මොහොතේම එම ලියුම ලබා ගන්න පුළුවන්. ඉස්සර අපි පැය ගණන් රස්තියාදු වෙනවානේ බැංකු වලට ගියාම පෝලිමේ ඉඳලා. එත් දැන් අන්තර්ජාලය ඔස්සේ ගෙවීම් කටයුතු කරන්න අවස්ථාව තියෙනවා. ඒවාගේම තමයි සමාජ ජාල වෙබ් අඩවි නිසා ලෝකයේ ඕනෑම තැනක සිටින හිතමිතුරන්ගේ තොරතුරු ඒ වේලාවේම දැන ගන්න පුළුවන්.

ඉතිං මෙවන් පහසුකම් රාශියක් සපයලා දුන්නත් තාක්ෂණය හරියාකාරව භාවිතා නොකිරීම නිසා ඇති වුණ අහිතකර බලපෑමත් සුළුපටු නැහැ. මේ ගැන නම් අම්මේ තාත්තේ අපි දෙපාරක් හිතන්න ඕන. විශේෂයෙන්ම අන්තර්ජාලය ඵලදායිව යොදා ගන්නේ කොහොමද මෙමගින් ඇතිවන හිතකර බලපෑම්

මොනවද කියලා ඔබත් දැනුවත් වෙලා ඔබේ දරුවත් දැනුවත් කරන්න. පොඞ්ඩක් හිතලා බලන්න මුහුණුපොත වැනි සමාජ ජාල මාධ්‍ය වලට දරුවන් කෙතරම් ඇබ්බැහි වෙලාද කියලා. මේ සමාජ ජාල වෙබ් අඩවි වල දන්න නොදන්න විවිධ වර්ගයේ මිනිස්සු ඉන්නවා. ඉතිං මේ විවිධ වර්ගයේ මිනිස්සුත් එක්ක සන්නිවේදනය කිරීම නිසාම පහුගිය කාලයේ අපේ දරුවන් කෙතරම් රවටීම් වලට ලක් වෙන්න ඇත්ද ? මේ සිද්ධීන් නිසා ජීවිත වලිනුත් වන්දි ගෙවපු අවස්ථා අපිට දකින්නට අහන්නට ලැබුණා.



ඉතිං අම්මේ තාත්තේ මේ තාක්ෂණයත් සමග සංවර්ධනය වෙන ලෝකේ අපේ දරුවනුත් තාක්ෂණයත් එක්ක ඉදිරියට යවන්න ඕන. තාක්ෂණය ප්‍රතික්ෂේප කරන්න බැහැනේ. අපේ දරුවෝ ලෝකයත් එක්ක ඉදිරියට යැවිය යුතුයි. මොකද අපේ දරුවොත් මේ විශ්ව ගම්මානයේ පුරුකක් කළ යුතුයි. හැබැයි මේ ගමන අපි යැවිය යුත්තේ කල්පනාවෙන් හා නිවැරදිවයි. කවුරුත් දන්නවනේ අන්තර්ජාලයට අයිතිකාරයෙක් නැති බව . ඒක නිසා අන්තර්ජාලයට විරුද්ධව නිති පනවලා යටපත් කරන්න බැහැ. අපි අන්තර්ජාලයට මොනවා හරි මුදා හැරියොත් ඒක මකන්න බැහැ. මේ බව ඔබේ ආදරණීය දරුවාට කියලා දෙන්න. මේ කාලේ දරුවන් තාක්ෂණයත් එක්කම ඉපදුණ නිසා තාක්ෂණය ගැන දරුවන් දන්න තරම් ඔබ නොදන්නවා විය හැකියි. හැබැයි දරුවන් තාක්ෂණය නිසා ඇතිවන අහිතකර බලපෑමෙන් මුදා ගෙන ඔවුන් තාක්ෂණයත් එක්ක ඉදිරියට යවන්න නම්,

- පොඩි කාලයේ සිටම දරුවන්ට අවශ්‍යය දේවල් පමණක් ලබා දීමට කටයුතු කරන්න.
- නව තාක්ෂණික මෙවලම් භාවිතයට ඔබත් හුරු වන්න.
- ඔබේ දරුවා පරිගණකය හෝ තාක්ෂණික මෙවලම් තුළට සීමා වීම වළක්වන්න.
- ඔබේ දරුවාගේ පරිගණකය නිවසේ සියල්ලන්ට ඇස ගැටෙන විවෘත පරිසරයක තබන්න.
- ස්වයං සංවරයට, ස්වයං විනයට මුල් තැන දී අන්තර්ජාලයේ යහපත් ප්‍රතිඵල නෙළා ගන්නට කියා දෙන්න.
- විශේෂයෙන්ම ඔබේ දරුවා සමාජ ජාල වෙබ් අඩවි තුළ සැරිසරයි නම් දන්නා සැබෑ ස්වරූපවලින් සිටින පුද්ගලයන් බවට තහවුරු කරගත් අය පමණක් තමන්ගේ යහළු ලැයිස්තුවලට එක් කර ගන්න උපදෙස් ලබා දෙන්න.
- ඔබේ දරුවන්ගේ සමාජ ජාල වෙබ් අඩවි ගිණුම් විමසුමට ලක් කර බලන්න.

- ඔබත් දරුවන්ගේ මිතුරු ජාලයේ සාමාජිකයෙක් වන්න.
- අන්තර්ජාලයට දත්ත ඇතුළත් කිරීමේ දී තම පුද්ගලිකත්වය තවකෙකුට නිරාවරණය නො කරන්නට දරුවා දැනුවත් කරන්න.
- තමාගේ වැදගත් තොරතුරු, දූරකථන අංක ආදිය හුවමාරු නොකරන්නට ඔවුන්ව පුහුණු කරවන්න.
- එසේම සමාජ ජාල වෙබ් අඩවි වලට ඡායාරූප, පෝස්ට් වැනි විවිධ දේවල් දැමීමේදී ඒ ගැන දෙපාරක් සිතන්න උපදෙස් දෙන්න
- විශේෂයෙන්ම අන්තර්ජාලය හරහා ගෙවීම් කිරීමට යාමේදී තුන්වන පාර්ශවයකට අපගේ දත්ත ලබා ගැනීමට නොහැකි වන පරිදි ගෙවීම සිදු කිරීමට සැලකිලිමත් වෙන ලෙස පවසන්න.
- සැමවිටම දෙපාරක් සිතා වැඩ කිරීමට පුරුදු කර වන්න.

# සුහුරුලිය - ඩිජිටල් තාක්ෂණයෙන් සවිබල ගැන්වූ සමාජයක් කරා.........

අඩු ආදායම් ලබන මට්ටමේ සිට මැදි ආදායම් ලබන මට්ටමේ රටක් දක්වා ශ්‍රී ලංකාව ඉදිරියට ආ ගමනේදී කාන්තාව ඉටු කළ නිහඬ කාර්යභාර්ය අතිමහත් බව අවිවාදාත්මක වේ. ගේදොර කටයුතුවල අරපිරිමැස්ම, පවුලේ ආදායමෙන් කොටසක් මතු ප්‍රයෝජනයට ඉතිරි කිරිම, ගෙවතු වගාව වැනි සරල සංකල්ප තුළින් ඇය අවසානයේ රටේ දියුණුවට ඉහළ දායකත්වයක් සපයා තිබේ. මේ අතර මෑතක සිට රට තුළ දක්නට ලැබෙන නව ප්‍රවණතාවයක් වන්නේ කාන්තාවන් ව්‍යාපාර ක්ෂේත්‍රය තුළ දක්වන වැඩි සහභාගීත්වයයි. එසේ වුවත් අවාසනාවකට මෙන් එවැනි කාන්තා ව්‍යවසායකයින්ට මුහුණ දීමට සිදුවන ගැටළු ගණනාවකි. ඉන් එක් වැදගත් ගැටළුවක් වන්නේ සීඝ්‍රයෙන් දියුණු වන නව විද්‍යා හා තාක්ෂණ දැනුම හා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ දැනුම තම ජීවන තත්වය නගා සිටුවා ගැනීමටත්

ව්‍යාපාර කටයුතු වලට යොදවා ගැනීමටත් ඇති දුබලතාවයයි. මෙම තත්වය මඟ හරවා ගැනීමටත් කාන්තාවන් මුහුණ දෙන සමාජීය හා ආර්ථික ගැටළු වෙනුවෙන් විසඳුම් ලබා දීම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය යොදා ගන්නේ කෙසේදැයි යන්න අරමුණු කර ගනිමින් WIFI - සුහුරුලිය නමින් වැඩසටහනක් 2016 වර්ෂයේ අග භාගයේ ශ්‍රී ලංකාවේදී ආරම්භ කරන ලදී. මෙම වැඩසටහන කාන්තාව හා තොරතුරු සන්නිවේදන තාක්ෂණ පෙරමුණු වැඩසටහනේ (Women & ICT Frontier Initiative - WIFI) ප්‍රථම දකුණු ආසියාතික වැඩසටහනයි.

මෙම වැඩසටහන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය සඳහා වූ ආසියා පැසිෆික් මධ්‍යස්ථානය - United Nation Asian and Pacific Training Centre for Information & Communication Technology for Development – (UN –APCICT) මඟින් හඳුන්වා දුන් අතර මෙය ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යෑම කාන්තා හා ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශයත්, ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිත ආයතනයත් (ICTA) සමඟ එක්ව සිදු කරයි.

කාන්තාවන් සමාජය තුළ මුහුණදෙන අභියෝග ජය ගැනීමටත් කාන්තා ව්‍යවසායකයින් හට තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතා කිරීමෙන් තම හැකියාවෙන් උපරිම ප්‍රතිඵල ලබා ගැනීමටත් මෙම පෙරමුණු වැඩසටහන මඟින් ලබා දෙන දැනුමෙන් හැකියාව ලැබේ. විශේෂයෙන්ම ව්‍යාපාර සැලසුම් කිරීමේදී හා කළමණාකරණයේ දී තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය හා සමාජ මාධ්‍ය භාවිතා කරමින් ව්‍යාපාර ප්‍රවර්ධනය කිරීම තුළින් කාන්තාව ආර්ථිකමය හා සමාජීය වශයෙන් සවිබල ගැන්වීම මෙම වැඩසටහනේ මූලික අරමුණුයි. මුළු රටම ආවරණය වන පරිදි සියළුම දිස්ත්‍රික්කවල කාන්තා ව්‍යවසායකයින් සවිබල ගැන්වීමේ පුහුණු වැඩසටහන් ප්‍රජා වැඩමුළු හරහා ගම් මට්ටමෙන් සිදු කිරීමට අපේක්ෂා කළ අතර මේ වන විට බදුල්ල, යාපනය, කිලිනොච්චිය, කුරුණෑගල, අනුරාධපුරය, නුවර, අම්පාර, මාතර යන දිස්ත්‍රික්කවල මෙම වැඩමුළු පවත්වා අවසන් කර තිබේ. මෙම වැඩසටහන රටේ බිම් මට්ටමේ කාන්තා ව්‍යවසායකයින් අතර පුළුල් වශයෙන් ව්‍යාප්ත කරමින් ඉන් වැඩි ප්‍රතිලාභ අත්කර දීමටත්, නව තාක්ෂණය සමග ඉදිරියට යන වත්මන් සමාජය වෙත සුහුරුලියක ලෙස විශ්වාසයෙන් යුතුව පිය නැගීමට අවශ්‍ය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ දැනුම ලබා දීමටත් මෙමගින් අපේක්ෂා කෙරේ.

# මුහුණුපොත හරහා සිදුවන අපරාධවලින් වැලකීමට නම්




## මුහුණුපොත වැනි සමාජ ජාලා වෙබ් අඩවි අපට අවශ්‍ය වන්නේ

**පෞද්ගලික සන්නිවේදන සම්බන්ධතා ගොඩ නගා ගැනීමට**

- මිතුරන් සමග සම්බන්ධ වීමට
- නව මිතුරන් සමඟ තොරතුරු හුවමාරු කර ගැනීමට
- නිවසින් පිටත සිටින පවුලේ සාමාජිකයන් සමග සමීප වීමට

**සමාජයීය අවශ්‍යතාවයන් සඳහා**

- විවිධ අධ්‍යාපනික, ක්‍රීඩා, විනෝද වැඩසටහන් ප්‍රචලිත කර ගැනීමට
- එම වැඩසටහන් මගින් සිදු කරන කාර්යයන් පිළිබඳ මහජනතාව දැනුවත් කිරීමට.

**ව්‍යාපාර කටයුතු සඳහා**

- ව්‍යාපාර කටයුතු ප්‍රචාරණය හා අලවිකරණ කටයුතු කර ගැනීමට
- වෙනත් ව්‍යාපාරිකයන් සමඟ සම්බන්ධ වීමට
- නව ව්‍යාපාරික අවස්ථා හඳුනා ගැනීමට.

**භාණ්ඩ හා සේවා අලවිකරණ කටයුතු සඳහා**

- විවිධ පාරිභෝගික අවශ්‍යතාවයන්ට අනුව තම භාණ්ඩ හා සේවා අලවිකරණයට

**රැකියා අවස්ථා උදා කර ගැනීම සඳහා**

- තමාට ගැලපෙන ගුණාත්මක රැකියා පහසුවෙන් සොයා ගැනීමට
- රැකියා අවස්ථා පිළිබඳ ප්‍රචාරණය සඳහා

## ඒත්... ඔබ දන්නවාද ? මුහුණුපොත නිසා....

- ඔබේ ඡායාරූප අවභාවිතයට ලක් විය හැකිය.
- ඔබේ පුද්ගලික තොරතුරු හා ඡායාරූප භාවිතා කර ව්‍යාජ ෆේස් බුක් පිටුවක් නිර්මාණය කර ඔබට අපහාස වන අන්දමින් භාවිතා කළ හැකිය.
- ඔබේ තොරතුරු සොරා ගෙන ඔබව තර්ජනය කිරීම්, මානසික හිංසා කිරීම්, මුදල් සූරා ගැනීම්, ලිංගික අල්ලස් ලබා ගැනීම් ආදී හිංසන වලට ගොදුරු විය හැකිය.
- මුදල් වංචාවලට හසු විය හැකිය.
- සිය දිවි හානි කර ගැනීම් හා අපරාධ සඳහා යොමු විය හැකිය.
- මානසික ව්‍යාකූලතා ඇති විය හැකිය.
- ඔබ ගොඩ නගාගෙන ඇති කීර්ති නාමයට හානි පැමිණිවිය හැකිය.

## එසේනම් සුරක්ෂිතව මුහුණු පොතේ සැරි සරන්නේ කෙසේද?



- සරල මුර පදයක් වෙනුවට පහසුවෙන් පිවිසිය නොහැකි මුර පදයක් යොදන්න.
- අකුරු, ඉලක්කම් සහ විශේෂ අකුරු ඇතුළත් මුරපදයක් යොදන්න.
- මුර පදය නිතර වෙනස් කරන්න.
- ඔබගේ ඊමේල් ගිණුම හා සමාජ ජාල ගිණුම් සඳහා එකම මුර පදයක් භාවිතා නොකරන්න.
- පොදු ස්ථාන වලදී හෝ අන් අයෙකුගේ සන්නිවේදන උපකරණයකින් ඔබේ ෆේස් බුක් ගිණුමට ඇතුල් වූයේ නම් ගිණුමෙන් “Log out” වීමට අමතක නොකරන්න.
- නොහඳුනන අය තමන්ගේ ගිණුමට එක් කර ගැනීමෙන් වළකින්න.
- පැහැදිලි අයිතිකරුවෙකු නොමැති ව්‍යාජ facebook ගිණුම් සමඟ සම්බන්ධතා පවත්වා ගැනීමෙන් වළකින්න.
- ඔබගේ facebook ගිණුමේ අතිශය පෞද්ගලික දත්ත පළ කිරීමෙන් වලකින්න.

- ඔබට ලැබෙන මිතුරු ඇරයුමක් තහවුරු කිරීමට ප්‍රථම එම පුද්ගලයා සනාථ කර ගන්න.
- Friend request එකක් යැවීමට ප්‍රථම එය අව්‍යාජ ගිණුමක් බවට ප්‍රත්‍යක්ෂ කර ගන්න.
- තම ගිණුමේ friend list එකේ සිටින පුද්ගලයන්ට පමණක් දැක ගත හැකි වන සේ අවශ්‍ය විස්තර පමණක් ඇතුළත් වන පරිදි පින්තූර හා post share කරන්න.
- ඔබගේ පෞද්ගලික තොරතුරු ඉල්ලා සිටින පුද්ගලයින් පිළිබඳ සැලකිලිමත් වන්න.
- කිසි විටෙකත් ඔබගේ පෞද්ගලික තොරතුරු (ලිපිනය, දුරකථන අංකය, නිවසේ තොරතුරු ආදිය) නොහඳුනන පුද්ගලයන් සමග හුවමාරු කර ගැනීමෙන් වළකින්න.
- ෆේස් බුක් සැකසුම් වල ඇති ද්වි සාධක සත්‍යාපනය ("two-factor authentication" ) භාවිතා කරන්න.
- ඔබ ජංගම දුරකථනයෙන් සමාජ ජාල වලට පිවිසේනම් එහි මුරපදය remember password කර තැබීමෙන් වළකින්න.
- යමෙක් ඔබට facebook ගිණුම හරහා හිරිහැර කරයි නම් අදාළ බලධාරීන් දැනුවත් කරන්න.

## නිවසේ ආරක්ෂක කැමරා පද්ධතියක් සවි කිරීම වැදගත් වන්නේ ඇයි?



ඉස්සර නම් අපේ ගෙවල් ආරක්ෂා කරන්න පාවිච්චි කළේ සැර බල්ලෙක් ඇති කිරිම, එළියේ ගිනි මැලයක් ගැසීම, නිවසේ ගෘහ මූලිකයා එළියේ පිළේ නිදා ගැනීම වැනි බොහෝම සරළ ක්‍රම ඒත් ඉතිං මේ කාලේට නම් ඉස්සර ක්‍රම හරියන්නේ නැහැ වර්තමාන සමාජය ඉතාම කාර්යබහුල වෙලා. ඒ වගේම තමයි අද වනවිට පවුල එහෙම නැත්නම් කුටුම්භය ඉතා පැහැදිලි ලෙස වෙනස්වීම්වලට ලක්වෙලා. ඉස්සර බොහෝ පවුල්වල අම්මා රැකියාවක නිරත වුණේ නැහැ. කවුරුහරි හැම වෙලාවෙම ගෙදර තුළ රැඳී සිටියා. අද දකින්න තියෙන විශාල තාප්ප ඉස්සර දකින්න ලැබුණේ කලාතුරකින්. ඒ වගේම තමයි අහල පහළ ගෙවල් අතර අදට වඩා ශක්තිමත් සම්බන්ධයක් දකින්න තිබුණා. අද බොහෝ ගෙවල්වල අම්මා තාත්තා දෙන්නම රස්සාවල් වලට යනවා. ඉස්කෝලේ යන දරුවන් උපකාරක පන්තිත් ගිහිං ගෙදර එන්නේ රෑ වෙලා. ඒ වගේම තමයි විශාල

ගෙවල් විශාල තාප්ප වලින් වට කර ගෙන. අසල්වැසි සම්බන්ධතා ඇත්තේම නැහැ. මේ විදියට අපේ සමාජ ක්‍රමය වඩාත් කාර්යබහුල වීමත් එක්ක සොරුන්ට සහ අපරාධකරුවන්ට ඔවුන්ගේ කටයුතු නිදහසේ කරගැනීමට ඉතා විශාල සහයක් ලැබිලා තියෙනවා. ඉතිං මේ තත්ත්වය නිසා මිනිස්සුන්ගේ ජීවිත වලට දේපළ වලට ආරක්ෂාව සම්බන්ධව ගැටළු බොහොමයක් මතු වෙලා තියෙනවා. ඒක නිසා මිනිස්සු තමන් හරි හම්බ කරපු දේවල්, මිල මුදල් ඒ වගේම තමන්ගේ ජීවිත ආරක්ෂා කර ගන්න විකල්ප ක්‍රම හෙව්වා.

ඉතිං මේකට විසඳුමක් විදියට තමයි නවීන තාක්ෂණික ක්‍රමයක් වන ආරක්ෂිත කැමරා පද්ධතියක් ගැන අපට අහන්න ලැබෙන්නේ. ඔයගොල්ලෝ හැමෝම මේ ගැන අහලා ඇති. මේකට කියන්නේ CCTV ( Closed Circuit Television) කියලා. මේ තාක්ෂණය ආරම්භ වෙන්නේ මීට අවුරුදු අසූවකටත් කලින්. ඒ කියන්නේ 1940 දී විතර. හැබැයි මේ තාක්ෂණය ජනතාව අතරට යන්නේ 1970 තරම් පසු කාලයක.

**අපි මුලින්ම බලමු මේ ආරක්ෂිත කැමරා පද්ධතියකින් අපට ලැබෙන වාසි.**

- ආරක්ෂිත කැමරා පද්ධතියක් සවිකර ඇති නිවසක් තුළට සොරුන් අපරාධකරුවන් ඇතුළුවෙන්න භයක් දක්වන නිසා සොරකම් කිරීම වගේම අපරාධ කිරීමත් අඩුවෙනවා
- ඒවාගේම සොරකමක් හෝ අපරාධයක් සිදුවූ විට එය හඳුනා ගැනීමට කැමරා පද්ධතියක් තුළින් හැකියාවක් ලැබෙනවා.
- ඔබ නිවසේ නොමැති අවස්ථාවලදී නිවසේ සිදු වන්නේ කුමක්දැයි සොයා බැලීමට. විශේෂයෙන්ම කුඩා දරුවන් සිටින ගෙවල් වල දරුවන් බලා ගන්නන් ඔවුන් හොඳින් රැක බලා ගන්නේ දැයි සොයා බැලීමට හැකියාවක් ලැබෙනවා.
- නිවසට පැමිණෙන්නේ කවුද යන්න නිරීක්ෂණය කිරීමට පුළුවන්.
- එදිනෙදා අනපේක්ෂිතව මුහුණ දෙන ආපදා ක්ෂණිකව දැනගැනීමට හැකියාවක් ලැබෙනවා.
- සොර සතුරු උවදුරු සම්බන්ධයෙන් සාක්ෂි වශයෙන් ආරක්ෂිත කැමරා පද්ධතියෙන් ලැබෙන වීඩියෝ පට භාවිතා කරන්න පුළුවන්.



**දැන් අපි ආරක්ෂිත කැමරා පද්ධතියකට අයිති කොටස් මොනවාද බලමු.**

## 1. කැමරාව

**කැමරා වර්ග ප්‍රධාන වශයෙන් වර්ග 4 ක් තියෙනවා.**

### රැහැන් රහිත කැමරා



මෙම කැමරා වර්ගය මිලදී ගැනීම සඳහා අධික මුදලක් වැය වන නිසා මෙම වර්ගයේ කැමරා ඉතා සුළු ප්‍රමාණයක් තමයි ගෙවල්වල සවි කරලා තියෙන්නේ. මෙම කැමරා ඉතාම පහසුවෙන් ස්ථාන ගත කරන්න පුළුවන්. රැහැන් නොමැති නිසා සොරුන්ට අපරාධකරුවන්ට මෙම කැමරා වර්ගය අක්‍රිය කරන්න ඉතා අපහසුයි.

### නයිට් විෂන් කැමරා



බොහෝ කැමරා වලින් රාත්‍රී කාලයේ දර්ශන හොඳින් පේන්නේ නැහැ. හැබැයි නයිට් විෂන් කැමාරාවේ ඇති විශේෂත්වය තමයි රාත්‍රී කාලයේ දර්ශන හොඳින් පේනවා. ඉතිං මේ වර්ගයේ කැමරා වලට ඉතා අඩු ආලෝක තත්ත්වයකදී වුවද පැහැදිලි රූප ලබා දෙන්නට හැකියාව තියෙනවා.

### ඉන්ඩෝර් කැමරා



ගොඩක් වෙලාවට ඉන්ඩෝර් කැමරා සවි කරන්නේ ගෙදර ඇතුළේ දර්ශන ලබා ගන්න. ඉතිං මේ කැමරා වලින් ලබා දෙන දර්ශන මගින් නිවස ඇතුළේ සිටින සාමාජිකයින්ගේ ආරක්ෂාව තහවුරු වෙනවා.

### අවුට්ඩෝර් කැමරා




අවුට්ඩෝර් කැමරා වල විශේෂත්වය තමයි මෙම කැමරා වලින් ලබා දෙන දර්ශන වලින් නිවසේ සාමාජිකයින්ව පිටස්තර පුද්ගලයින්ගෙන් ආරක්ෂා කරගැනීම. මෙම කැමරා වත්තේ සුදුසු ස්ථාන වල සවි කරලා තියෙනවා. මෙම කැමරා වලින් ලබා දෙන දර්ශන වලින් නිවසට හෝ භූමියට ඇතුලු වන්නේ කවුරුන්දැයි දැනගන්නට පුළුවන්.

## 2. රෙකෝඩරය




කලින් කියපු සියලු කැමරා වලින් ලැබෙන දර්ශන පටිගත වන්නේ රෙකෝඩරය තුල. රෙකෝඩරය වෙනුවට පරිගණකයක් සම්බන්ධ කර ගන්න හැකියාව තියෙනවා.

## 3. කේබලය



කැමරාවේ ඉදලා රෙකෝඩරය දක්වා අදාළ දත්ත ගෙන යන්නේ කේබල් හරහායි. මේ කේබල් සවි කරන විට ඒවායේ දිග ගැන විශේෂයෙන්ම සැලකිලිමත් විය යුතුයි. මොකද උවමනාවට වඩා දිගින් වැඩි වුනොත් ඒ හරහා යන දත්ත වලට ඇති ප්‍රතිරෝධය වැඩි නිසා බාධා වෙන්න පුලුවන්.

## 4. රවුටරය



ආරක්ෂිත කැමරා පද්ධතිය හරහා එන දත්ත අන්තර්ජාලය හරහා නිරීක්ෂණය කරන්න අවශ්‍ය නම් පමණක් රවුටරයක් භාවිතා කළයුතු ම වෙනවා. මෙමගින් කොතනක සිටියත් අපි ළඟ තියෙන ස්මාර්ට් දුරකථනය මගින් නිවසේ කැමරා පද්ධතියේ IP ලිපිනය යෙදීමෙන් ඒ හා සම්බන්ධ වන්නට හැකියාව තිබෙනවා.

**ආරක්ෂිත කැමරා පද්ධතියක් සවි කරන්න කලින් සැලකිලිමත් විය යුතු කාරණා**

- මුලින්ම නිවසේ කැමරා සවිකල යුත්තේ කොතැනටද යන්න තීරණය කරලා කැමරාවක් මගින් වැඩි ප්‍රදේශයක් ආවරණය වන පරිදි සැලසුමක් හදාගන්න. මෙහිදි දත්ත හුවමාරුවේදී බාධා අවම වන ආකාරයට කැමරා සවි කිරීමට වග බලා ගන්න.

- කැමරාව තෝරා ගැනීමේදී සැලකිලිමත් වෙන්න ඕන තාක්ෂණික කරුණු කිහිපයක් තියෙනවා.
    - Camera Lens size
    - Chip / Sensor size
    - TVL (TV Line Resolution- මෙම අගය අවම වශයෙන් 700 ක් වත් වනවානම් හොදයි).
    - Lux Levels
    - IP rating

- කැමරාව යකඩ බාර් මත සවිකරන විට ලී කැබැල්ලක් තබා ඒ මත සවි කිරීමෙන් අකුණුවලින් වන හානි වළක්වා ගන්න පුළුවන්.

- සියලුම කැමරා වල වයර PVC නල තුලින් රෙකෝඩරය වෙත රැගෙන යන්න.

- රෙකෝඩරය ආරක්ෂා සහිත ස්ථානයක එනම් පහසුවෙන් කිසිවකුට ලඟා විය නොහැකි තැනක තබන්න

- ආරක්ෂක කැමරා පද්ධතියට සම්බන්ධ වීමේදී ඔබ භාවිතා කරන මුරපද හා අන්වර්ථ නාම කිසිවකුට නොදෙන්න වග බලා ගන්න මතක තියා ගන්න.

# ව්‍යාජ වෙබ් අඩවි හඳුනා ගන්නේ කෙසේද ?

- වෙබ් අඩවියකට පිවිසීමට පෙර හෝ සබැඳියක් ක්ලික් කිරීමට පෙර අදාළ වෙබ් ලිපිනය සැබෑ වෙබ් අඩවියක් දැයි පරීක්ෂා කර බලන්න.

- නොදන්නා වෙබ් පිටුවකට පිවිසීමට ප්‍රථම වෙබ් අඩවියේ නම ගූගල් සෙවුම් යන්ත්‍රයේ ටයිප් කර ඉන් ලැබෙන ප්‍රතිඵලය සමාලෝචනය කරන්න.




- වෙබ් අඩවියකට අදාල වෙබ් ලිපිනය "https" සමග බැඳි වෙ බ් අඩවියක් නම් එය "http" ප්‍රොටෝකෝලය සමග බැඳි වෙබ් අඩවියකට වඩා ආරක්ෂාකාරි වේ.

- ඔබ අන්තර්ජාලය හරහා ගණුදෙණු කරන්නේ නම් එම වෙබ් අඩවියේ ගෙවීම් පිටුව ඉහත සඳහන් කළ " https" සමග බැඳි වෙබ් පිටුවක් ද යන්න තහවුරු කරගෙන ගණුදෙණු කරන්න. මෙය ඔබට සොයා ගැනීමට නොහැකි නම් එම වෙබ් අඩවියට ඔබගේ පෞද්ගලික තොරතුරු, ක්‍රෙඩිඩ් කාඩ් පත් තොරතුරු දීමෙන් වළකින්න. .Net හෝ .org වැනි වසම් නාම (Domain Name) වලින් අවසන් වන වෙබ් අඩවි අන්තර්ජාල සාප්පු සවාරි සඳහා කලාතුරකින් භාවිතා වන බැවින් මෙවැනි වසම් නාම ඇති වෙබ් අඩවි පිළිබඳ විශේෂයෙන් සැලකිලිමත් වෙන්න.

- ඔබගේ බ්‍රව්සරයේ වෙබ් ලිපින තීරුවේ (URL) වෙබ් අඩවියේ ආරක්ෂක තත්ත්වය




පරීක්ෂා කර බලන්න. බොහෝ බ්‍රව්සර් සඳහා, "ආරක්ෂිත" (Secure) වෙබ් අඩවියක් දැයි යන්න වෙබ් අඩවියේ URL හි වම්පස හරිත පැඩ්ලොක් නිරූපකයක් / ඉබි යතුරක් මගින් පෙන්වා ඇත. තවද වෙබ් අඩවියේ විස්තර සත්‍යාපනය කිරීමට ඔබට පැඩ්ලොක් අයිකනය මත ක්ලික් කළ හැකිය.

- ඔබ පිවිසෙන වෙබ් අඩවියේ ලිපින තීරුව (address bar) මත ඇති පැඩ්ලොක් අයිකනය ක්ලික් කිරීම මගින්, SSL සහතිකයේ විස්තරයන් බැලීමට ද ඔබට හැකියාව ඇත.




- ඔබ පිවිසෙන වෙබ් අඩවිය තුළ සිත් ඇදගන්නාසුළු දැන්වීම් විශාල ප්‍රමාණයක්

තිබේ නම් එය බොහෝ විට විශ්වසනීය වෙබ් අඩවියක් නොවීමට හැකියාව ඇත.

- ඔබ පිවිසීමට අපේක්ෂා කරන වෙබ් අඩවියේ % සංකේත පොකුරක් ඇත්නම් ඒ පිළිබඳ ප්‍රවේශම් වන්න.

- බොහෝ ව්‍යාජ වෙබ් අඩවි සඳහා දුර්වල ඉංග්‍රීසි අක්ෂර වින්‍යාශ සහිත වචන විශාල සංඛ්‍යාවක් , දුර්වල ව්‍යාකරණ, අමුතු වාක්‍ය ඛණ්ඩ භාවිතා කරන බැවින් ඒ පිළිබඳ සැලකිලිමත් වන්න.

- වෙබ් අඩවියේ "සම්බන්ධතා" පිටුව භාවිතා කර වෙබ් අඩවියේ නීත්‍යානුකූලභාවය තහවුරු කර ගැනීම සඳහා සපයා ඇති අංකය හෝ විද්‍යුත් තැපැල් ලිපිනය හරහා ඔබට වෙබ් අඩවියේ අයිතිකරුගෙන් ප්‍රශ්ණ, අදහස් සහ ගැටළු විමසිය හැක.

- ඔබ පිවිසීමට අපේක්ෂා කරන වෙබ් අඩවියේ ඩොමේන් වයස පරීක්ෂා කිරීමෙන් මෙම වෙබ් අඩවිය කොපමණ කාලයක් ව්‍යාපාරයේ යෙදී ඇත්දැයි ඔබට දැක ගත හැකි අතර, එහි නිරවද්‍යතාව පිළිබඳ වඩා හොඳ අවබෝධයක් ඔබට ලබා ගැනීමට හැකි වේ.

- ඩොමේන් නාමයක් ලියාපදිංචි කර ඇත්තේ කාටද, ඔවුන් සිටින්නේ කොහේද, සහ වෙබ් අඩවිය කොපමණ කාලයක් ක්‍රියාකාරී වී ඇත්ද යන්න පිළිබඳ තොරතුරු WhoIs Lookup Domain Tracker මඟින් පරික්ෂා කළ හැක.

- ඔබ පිවිසීමට අපේක්ෂා කරන වෙබ් අඩවියේ නීත්‍යානුකූලභාවය තහවුරු කිරීමට, අන්තර්ජාලයේ ආරක්ෂාව සම්බන්ධ විශ්වාසවන්ත බව හැඟවෙන සලකුණු විශ්වාසදායී මුද්‍රාවන් (Trust Seals) තිබේදැයි පරීක්ෂා කර බලන්න.

- වෙබ් අඩවියක් ආරක්ෂිතද යන්න තීරණය කිරීම සඳහා, Google Safe Browsing Transparency වාර්තාව මගින්ද සොයා ගත හැක. මේ සඳහා අදාල වෙබ් අඩවිය





Google Safe Browsing Transparency Report හි නියමිත ස්ථානයේ ටයිප් කර අදාල වාර්තාව ලබා ගැනීමට හැකිය.

- නොදන්නා ප්‍රවාහයකින් ලැබෙන ඊමේල් පණිවිඩ හරහා ලැබෙන සබැඳි බොහෝ විට ව්‍යාජ ඒවා විය හැකි බැවින් ක්ලික් කිරීමය පෙර දෙවරක් සිතන්න.

- ඔබේ පරිගණකයට / ජංගම දුරකථනයට සෑම විටම ප්‍රති-වෛරස් මෘදුකාංගයක් ස්ථාපනය කර එය යාවත්කාලීන කර තබා ගන්න.

# මොකක්ද මේ උපාංග පදනම් කරගත් අන්තර්ජාලය (Internet of Things) කියන්නේ ?




දැනට අපි භාවිතා කරන අන්තර්ජාලය නිර්මාණය වී ඇත්තේ පුද්ගලයින් හා උපාංග අතර ගොඩනගා ගත් සබඳතා ජාලයක් මතයි. මෙහිදී පුද්ගලයින්ගේ ඉල්ලීම් මත අන්තර්ජාලය රඳා පවතී. නමුත් උපාංග පදනම් කරගත් අන්තර්ජාලය (IoT) යනු මානව සහභාගිත්වයකින් තොරව විවිධ උපකරණ හා උපාංග අන්තර්ජාලය ඔස්සේ සන්නිවේදනය කිරීමේ තාක්ෂණයයි. මෙහිදී මානව සහභාගිත්වයකින් තොරව උපාංගයන් විසින්ම එක් එක් උපාංග අතර දත්ත හුවමාරු කර ගනී. නව පරිගණක තාක්ෂණයන් යොදා ගනිමින් උපාංග එකිනෙක සම්බන්ධීකරණය කරමින් කාර්යක්ෂම සේවාවක් ලබා දීම සඳහා ගෝලීය යටිතල ව්‍යුහයක් නිර්මාණය කර දීමට මෙම නව අන්තර්ජාලය කටයුතු කරයි. මෙහි ඇති විශේෂත්වය නම් මෙම අන්තර්ජාලයට සම්බන්ධ සියළුම උපාංගයන් සංවේදනය කිරීමට සහ හසුරුවීමට පවතින ජාලකරණ යටිතලයන් ඔස්සේ අවස්ථාව ලබා දීමත් එමගින් භෞතික ලෝකය සහ පරිගණකමය පද්ධති අතර වඩාත් ශක්තිමත් සබඳතාවයක් ගොඩනැඟීමට අවස්ථාව උදාකර දීමත්ය. මෙමගින් කාර්යක්ෂමතාව සහ නිරවද්‍යතාවය ඉහළ නැංවීමටත් මිනිස් ශ්‍රමය අවම කරගැනීමටත් ආර්ථික ප්‍රතිලාභයන් අත්පත් කර ගැනීමටත් හැකියාව ලැබේ.

උපාංග පදනම් කරගත් අන්තර්ජාල පද්ධතිය නිර්මාණය වී ඇත්තේ උපකරණවලිනුත්, එම උපකරණ වල ක්‍රියාකාරිත්වය සන්නිවේදනය කර ගැනීම සඳහා සැකසු සංවේදක හා පාලක පද්ධතියකිනුත්ය.



මෙහි ඇති සංවේදකවලින් ලබා ගන්නා දත්ත හෝ පාලක පද්ධතිය මගින් ජනනය කරන දත්ත අන්තර්ජාලය හරහා ලබාගැනීමට සහ එම දත්ත ඇසුරෙන් එම උපකරණයේ ක්‍රියාකාරීත්වය පාලනය කිරීමට හැකි අතුරු මුහුණතක්ද මෙම පද්ධතියට ඇතුලත්ය. මහා මාර්ග ආලෝකමත් කිරීමට සවිකර ඇති විදුලි ලාම්පු ස්වයංක්‍රීයව පාලනය කිරීම සඳහා ද දැන් බොහෝ රටවල උපාංග පදනම් කරගත් අන්තර්ජාලය භාවිතා කරයි. මෙහිදි සංවේදකයක් මගින් යම් මට්ටමකට වඩා ආලෝකය අඩු වූ විට ස්වයංක්‍රීයව වීදි පහන් දැල්වීමටත්, යම් මට්ටමකට වඩා ආලෝකය වැඩි වූ විට ස්වයංකියව වීදි පහන් නිවා දැමීමටත් IoT උපාංග වලට හැකියාව ඇත. බොහෝ රටවල් මෙම නවීන තාක්ෂණය භාවිතා කරමින් දැනටමත් ස්මාර්ට් නගර (Smart Cities) නිර්මාණය කිරීමද ආරම්භ කර ඇත.

උපාංග පදනම් කරගත් අන්තර්ජාලයේ ඇති වාසි

- කාර්යක්ෂමතාව හා පහසුව
- දත්ත වල විශ්වාසවන්ත භාවය
- ස්වයංක්‍රීයව දත්ත ගබඩා කිරීමේ හැකියාව
- විශාල දත්ත ප්‍රමාණයක් එකවර විශ්ලේෂණය කිරීමට
- ස්වයංක්‍රීයව කාර්යයන් කිරීමේ හැකියාව

උපාංග පදනම් කරගත් අන්තර්ජාලයේ ඇති අවාසි

- තාක්ෂණය මත අධික ලෙස විශ්වාසය තැබීමට සිදුවීම.
- ස්වයංක්‍රීයකරණය ප්‍රවර්ධනය කිරීම තුලින් රැකියා විරහිත භාවය ඇතිවීම.
- IOT උපකරණ වල අයිතිය ඇති සමාගම් වලට ගබඩාකර ඇති තොරතුරු අනිසි ලෙස භාවිතා කල හැකි වීම.
- නඩත්තුව අපහසු වීම හා සංකීර්ණ වීම.

2020 වර්ෂය වනවිට උපාංග පාදක කරගත් අන්තර්ජාලය තුළ බිලියන 30කට ආසන්න උපාංග සංඛ්‍යාවක් සාමාජිකත්වය දරනු ඇති බවට විශේෂඥයෝ ඇස්තමේන්තු කර ඇත.

# Google Chrome කෙටිමං යතුරු



| කෙටිමං යතුරු<br>Shortcuts | විස්තර<br>Description |
|---|---|
| Ctrl + (- හෝ +) | පිටුවක ප්‍රමාණය වැඩිකිරීම (+) හෝ කුඩා (-) කිරීමට. |
| Ctrl + 1-8 | Ctrl සහ 1 සිට 8 දක්වා ඕනෑම අංකයක් එබීමෙන් ඔබේ ටැබ් තීරුවේ අනුරූප පටිත්ත වෙත ගමන් කිරීමට. |
| Ctrl + Shift + Del | පුද්ගලික දත්ත ඉක්මනින් ඉවත් කිරීම සඳහා බ්‍රවුසින් දත්ත ඉවත් කරන්න කවුළුව විවෘත කිරීමට. |
| Ctrl + Shift + B | පොත් සලකුණු (book mark) තීරුව සැඟවීමට හා පෙන්වීමට. |
| Ctrl + D | දැනට විවෘත කර ඇති පිටුව සඳහා පිටු සලකුණක් එක් කිරීමට. |
| Ctrl + F | විවෘත පිටුවේ වචන සෙවීමට "සෙවීම් (Find)" තීරුව විවෘත කිරීමට. |
| Ctrl + O. | බ්‍රව්සරයේ ගොනුවක් විවෘත කරන්න |
| Ctrl + Shift + O | පොත් සලකුණු කළමනාකරු (bookmark manager) විවෘත කරන්න. |
| Ctrl + H | බ්‍රව්සරයේ ඉතිහාසය නව කවුළුව විවෘත කරන්න. |
| Ctrl + J. | බාගැනීම් කවුළුව පෙන්වන්න |
| Ctrl + N | නව බ්‍රව්සර කවුළුවක් විවෘත කිරීමට. |
| Ctrl + Shift + N | පුද්ගලික නව කවුළුවක් විවෘත කිරීමට. |
| Ctrl + P | වත්මන් පිටුව හෝ රාමුව මුද්‍රණය කිරීමට. |
| Ctrl + R හෝ F5 | වත්මන් පිටුව හෝ රාමුව අළුත් කිරීමට. |
| Ctrl + W. | දැනට තෝරාගෙන ඇති කවුළුව වසා දැමීමට. |
| Ctrl + Shift + W | දැනට තෝරාගෙන ඇති කවුළුව වසා දැමීමට. |
| Ctrl + Tab | දකුණට ඇති සෑම විවෘත ටැබ් එකක් හරහා ගමන් කිරීමට. |
| Ctrl + Shift + Tab | වම් පැත්තට ඇති සෑම විවෘත ටැබ් එකක් හරහා ගමන් කරයි. |

# කාන්තා ඔබට කරදරයක්ද ? උදව්වක් අවැසිද ?
# ළමා හිංසනයක් දුටුවාද ?
# අමතන්න අපව

**facebook අපේ මිතුරෙකු වන්න.....**

***Ministry of Women and Child Affairs and Social Security***

**සයිබර් අපරාධ ගැන පැමිණිලි ඇත්නම්**

**පහත ආයතන වලට කථා කරන්න....**

ළමා අපයෝජන පිළිබඳ පැමිණිලි - **1929**

කාන්තා අපයෝජන පිළිබඳ පැමිණිලි - **1938**

පොලිස් විමර්ශන අංශයේ පරිගණක

ආරක්ෂණය සම්බන්ධ ඒකකය - **119**

හදිසි තොරතුරු සේවය - **118**

රාජ්‍ය තොරතුරු කේන්ද්‍රය - **1919**

තාක්ෂණික සහය සඳහා **CERT** ආයතනය

**011-2691692, 011-2695749, 011-2679888**

කාන්තා හා ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය

දුරකථනය : **011-2186055** ෆැක්ස් : **011-2187249**

තොරතුරු තාක්ෂණ අංශය
කාන්තා හා ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය
තුන්වන වන මහල,දෙවන අදියර,සෙත්සිරිපාය
බත්තරමුල්ල
දු.ක : 0112186176 ෆැක්ස් : 0112186431
ඉමේල් : it@childwomenmin.gov.lk
වෙබ් :www.childwomenmin.gov.lk